# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/33 - 2014 අගෝස්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2014.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(208 වන පරිච්ඡේදය වන) 1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත**

25 වැනි වගන්තිය යටතේ නියමය

1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 25 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය නම්බුකාර හැළඹගේ රාජිත හරිස්චන්ද්‍ර සේනාරත්න වන මම, ඉහත කී පනතේ 2 වගන්තිය යටතේ 1964 ඔක්තෝබර් 01 වැනි දින අංක 14,186 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නීතිගත කිරීමේ ආඥාවෙන් පිහිටුවනු ලැබූ ලංකා ධීවර සංස්ථාවට, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රජය සතු නිශ්චල දේපළ, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ සහ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමන්ගේ එකඟත්වය ඇතිව මින් පවරමි.

නම්බුකාර හැළඹගේ රාජිත හරිස්චන්ද්‍ර සේනාරත්න,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2014 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මෝදර ගමේ ලුණුපොකුණ නැමැති කොළඹ මහ නගර සභා අංක 5 දරන නගර සභා කොට්ඨාසයේ වරිපනම් අංක 111 හි පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් අධිකාරි කේ. ඒ. යූ. එන්. කස්තුරි මහතාගේ 1996.09.16 දිනැති කො. 7695 දරන මූලික පිඹුරේ කැබලි අංක 2,3,4 වශයෙන් සලකුණු කළ, බෙදා වෙන් කර ඇති පහත දැක්වෙන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම පහයි තුනයි පහ (හෙක්ටයාර් 0.535) ක ප්‍රමාණයෙන් යුතු සියළුම ඉඩම් කැබලි -

**කැබලි අංක 02**

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 1 සහ 15 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 15, 3, 6, 4 සහ 5 ; |
| *දකුණට* | : | කැබලි අංක 4, 5 සහ පී. පී. කො. 1308 පිඹුරේ කැබලි අංක 1 ; |
| *බටහිරට* | : | පී.පී.කො. 1308 පිඹුරේ කැබලි අංක 1 සහ ඉහත කී 7695 දරන මූලික පිඹුරේ කැබලි අංක 1. |

යන මායිම් තුල පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි අටයි තුන (හෙක්ටයාර් 0.283) ක ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එය මත පිහිටි ස්ථිර ගොඩනැගිලි තුන සහ තාවකාලික ගොඩනැගිලි දෙකද ඇතුලු සියළු දේ ද.

1A - G 20152 — 10 (2014/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැබලි අංක 03**

*උතුරට* : කැබලි අංක 15, 17 සහ සී.එල්.පී. 1 පිඹුරේ කැබලි අංක 5, කැබලි අංක 7, 8, 9, 11, 12, 13 සහ 14 ;
*නැගෙනහිරට* : සී.එල්.පී. 1 පිඹුරේ කැබලි අංක 5 සහ රොක්හවුස් පටුමග සහ මෙම පිඹුරේ කැබලි අංක 6, 7, 8, 9, 10, 11, 12, 13 සහ 14 ;
*දකුණට* : රොක්හවුස් පටුමග සහ කැබලි අංක 6 සිට 14 දක්වා සහ කැබලි අංක 4 සහ 2 ;
*බටහිරට* : කැබලි අංක 6 සිට 10 දක්වා සහ කැබලි අංක 13, 14, 4, 2 සහ 15.

යන මායිම් තුල පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි තුනයි හය (හෙක්ටයාර් 0.236) ක ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල සහ.

**කැබලි අංක 04**

*උතුරට* : කැබලි අංක 2, 3 සහ 6 ;
*නැගෙනහිරට* : රොක්හවුස් පටුමග සහ කැබලි අංක 6 ;
*දකුණට* : රොක්හවුස් පටුමග සහ කැබලි අංක 5 ;
*බටහිරට* : කැබලි අංක 5 සහ 2.

යන මායිම් තුල පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි හය (හෙක්ටයාර් 0.016) ක ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල වේ.

09 - 422

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.